# මහාවිහාරයෙහි කාර්යභාරය

ලෝකයේ ඇත්තේ එකම ආගමක් පමණය, එකම විද්‍යාවක් පමණය ආදී වශයෙන් ප්‍රකාශකරන්නා එක්කෝ වංචනකියෙක් නැත්නම් මුග්ධයෙක් වෙයි. බැලූ බැල්මට පවා බටහිර වෛද්‍ය විද්‍යාව (එය විද්‍යාවක් යැයි කීව ද තාක්ෂණයකි) ආයුර්වේදයෙන් හෝ සිද්ධ වෙදකමෙන් හෝ සිංහල වෙදකමෙන් හෝ වෙනස්වෙයි. සියළු වෙදකම් එකම යැයි කියන්නා ආයුර්වේදයේ රෝග විනිශ්චයෙහි යොදාගන්නා ක්‍රමවේදය බටහිර වෛද්‍ය විද්‍යාවෙහි යොදාගන්නා ක්‍රමවේදය හා සමානවන්නේ යැයි සිතන්නේ ද? ජීවිතයේ කිසිම දිනක කිසිම සංකල්පයක් හෝ ප්‍රවාදයක් හෝ නිර්මානය නොකළ ද, මෙරට ප්‍රබුද්ධයන් අතර බුද්ධිමතකු ලෙස සැලකෙන මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතා වරෙක කියා සිටියේ රෝග තුන්වර්ගයක් ඇති බවත්, එක් වර්ගයක් ප්‍රතිකාර නොගත්තත් සුවවන බවත්, තවත් වර්ගයක් ප්‍රතිකාර ගැනීමෙන් සුවවන බවත්, තුන්වන වර්ගය ප්‍රතිකාර ගත්තද සුව නොවන බවත් ය. ඒ මහතා තවදුරටත් උපහාසයෙන් ප්‍රකාශකර සිටියේ ආයුර්වේදයෙන් සුවවන්නේ පළමු වර්ගයේ රෝග බව ය. කාලෝ ෆොන්සේකා මහතා ඉන් කියා සිටියේ ආයුර්වේදය වෛද්‍ය විද්‍යාවක් නොවන බව ය.

ලෝකයේ ඇත්තේ එකම විද්‍යාවක් පමණක් යැයි කියන්නවුන් බොහෝ විට අවසන්වන්නේ ලෝකයේ ඇති එකම විද්‍යාව බටහිර විද්‍යාව කියා ය. කාලෝ ෆොන්සේකා මහතාගේ මතය කුමක් වුවත් ආයුර්වේදය වෛද්‍ය විද්‍යාවක් බවත් ඒ තාක්ෂණය යම් විද්‍යාවක් මත පදනම් වී ඇති බවත් පැහැදිලි ය. එමෙන් ම ඇතැම් අවස්ථාවල බටහිර වෛද්‍ය විද්‍යාවෙන් සුවකළ නොහැකි වූ රෝග ආයුර්වේදයෙන් සුවකර ඇත. මෙලෙස විද්‍යාවන් හා ඒ සම්බන්ධ වූ තාක්ෂණ විවිධ වන්නේ ඇයි? කෙටියෙන් කියන්නේ නම් එක් දැනුම් පද්ධතියක් තවත් දැනුම් පද්ධතියකින් වෙනස්වන්නේ ඇයි?

අප ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්නේ චින්තනය යන සංකල්පය යොදාගනිමිනි. චින්තනය යන සංකල්පය වංචනිකයන්ට කෙසේ වෙතත් මුග්ධයන්ට අවබෝධකරගැනීම අසීරු ය. ඔවුන්ට ඒ නොතේරෙන්නේ නම් ඔවුන් කළ යුත්තේ ඒ ගැන අවඥා මුඛයෙන් කතාකිරීම නොව ඒ ඉගෙනගැනීමට උත්සාහ දැරීම ය. ඒ සඳහා ඔවුන්ට පළමුව චින්තනයට වඩා සරල සංකල්පයක් වූ සුසමාදර්ශය (paradigm) යන සංකල්පය හැදෑරිය හැකි ය. තෝමස් කුන් පඬිවරයා විසින් නිර්මානයකරන ලද මේ සංකල්පය ඔහුගේ “ද ස්ට්‍රක්චර් ඔෆ් සයන්ටිෆික් රෙවලූෂන්” (The Structure of Scientific Revolution) නම් කෘතිය කියවීමෙන් දැනගත හැකි ය.

ආගම් සම්බන්ධයෙන් ද තත්වය එසේ ම ය. ක්‍රිස්තියානි ආගම්, යුදෙව් ආගම, ඉස්ලාම් ආගම් එක් පැත්තකින් ඒකදේව නිර්මාණවාදී ආගම් වෙයි. අනෙක් පැත්තෙන් එහි සංසාරය යනුවෙන් සංකල්පයක් නැත. ඒ ආගම්වලට අනුව මිනිසා මරණින් පසු එක්වරක් පමණක් නැවත ඉපදෙයි. ඒ ස්වර්ගයෙහි හෝ නිරයෙහි ය. එහෙත් හින්දු, බෞද්ධ හා ජෛන ආගම්වල සංසාරය නම් සංකල්පය වෙයි. එසේ වූ පමණින් ද ඒ ආගම් සමාන නො වෙයි. හින්දු ආගමෙහි නිර්මාණවාදයක් වෙයි. බුදුදහමෙහි නිරාමාණවාදයක් නැත. බුදුදහම ගත්ත ද මහායානය හීනයානය යනුවෙන් භේදයක් වෙයි. එහි තව තව ප්‍රභේද වෙයි. මේ විවිධ දැනුම් ය. සැම ආගමකම උගන්වන්නේ මිනිසාට යහමග යැමට යැයි කියා ප්‍රශ්නයෙන් ගැලවී යා හැකි නො වේ. ඒ ඒ ආගමෙහි යහමග යන්න නිර්වචනය වන්නේ විවිධ ආකාරයෙනි.

මහායානික ප්‍රභේදයක් වූ මාධ්‍යමිකවාදය ථෙරවාදයට එරෙහිව එල්ලකළ අභියෝගය ගැන අපි සඳහන්කෙළෙමු. අප කියා සිටියේ ථෙරවාදීන් ඒ විවේචනය සැහෙන දුරකට පිළිගෙන ආත්මවාද වූ ධර්මවාදය, ස්වභාවවාදය ප්‍රතික්ෂෙපකළ යුතුව තිබූ බව ය. එහෙත් ඉන් අදහස්කරන්නේ මාධ්‍යමිකයන්ගේ සියළු දැනුම් ථෙරවාදීන් විසින් පිළිගනු ලැබිය යුතුව තිබුණිය යන්න නො වෙයි. අනිත්‍ය දුක්ඛ අනාත්ම ශූන්‍ය ගැන බුදුන්වහන්සේ දේශනාකර ඇති මුත් උන්වහන්සේ ශූන්‍යතාවක් ගැන සඳහන්කර නැත. ශූන්‍යත්වය යනු නාම පදයකි. එහි කිසිවක් නැති වුව ද ඒ ඇත. සියල්ල සාපේක්ෂව ගතයුතු යැයි දෙසූ නාගර්ජුනපාදයන් වහන්සේ ශූන්‍යතාවට විරුද්ධයක් ගැන නො දෙසූහ.

නිවන පවා සසරට සාපේක්ෂව ගත් නාගර්ජුනපාදයන් වහන්සේ ශූන්‍යතාව නිරපේක්ෂව ම ගත්හ. ථෙරවාදීන් කළයුතු ව තිබුණේ ධර්මවාදය මෙන් ශූන්‍යතාවාදය ද අත්හැරීම ය. එහෙත් එකල එවැන්නක් නො සිදුවිණි. එහෙත් අද අපට

© Prof. Nalin De Silva

ඒ කළ හැකි ය. ශූන්‍යතාව අත්හැර මනස පිළිබඳ වෙනත් ආකෘතියක් ගොඩනැගීම මගින් මාධ්‍යමිකවාදය මෙන් ම අසංග, වසුබන්ධු ආචාර්යවහන්සේලාගේ බෞද්ධ විඥානවාදය (යෝගාවචරවාදය) ද ප්‍රතික්ෂෙප කළහැකි ය. ශූන්‍යතාව අවසාන වශයෙන් සේවය කෙළේ ශංකරාචාර්යයන් වහන්සේට නිර්ගුණ් බ්‍රහ්මන් නිරාමානයකිරීමට යැයි කීම අතිශයෝක්තියක් නො වේ.

ථෙරවාදීන් නාගර්ජුනපාදයන්වහන්සේගේ ඇතැම් විවේචන භාරගෙන ශූන්‍යතාවාදය ප්‍රතික්ෂෙපකෙළේ නම් ඇතැම්විට භාරතයේ පසුකලෙක හින්දු ආගමේ නැගී සිටීමට එරෙහිව යම් බලපෑමක්කිරීමට සමත්වීමට තිබුණි. ඒ කෙසේ වෙතත් ථෙරවාදීන් භාරතයේ ආරක්ෂණවාදී පියවරක් ගැනීම එරට ථෙරවාදයේ යහපතටවත් හේතු නො වී ය. මුස්ලිම් ආක්‍රමණය එන තෙක් භාරතයේ මතවාදී ආධිපත්‍යය හින්දු ආගමට හා අදාළ දැනුම් පද්ධතියට හිමිවිය.

එහෙත් ලංකාවේ එසේ නො වී ය. සිංහල බුද්ධාගමේ මුල්බැසගැනීමත් සමග බ්‍රාහ්මණ ආගම්වලට මෙරට තැනක් තිබිණි නම් ඒ නැති වී ගියේ ය. ලංකාවේ ථෙරවාදීන්ට අවශ්‍ය වූයේ ප්‍රධාන වශයෙන් ම මහායානය පැරදවීම ය. ථෙරවාදයේ නිල භාෂාව පාලි බවට පත්කිරීමත් සමග සිංහල බුද්ධාගම එවකට තිබූ තත්වයෙන් ම පසුව පවත්වාගෙන යෑමට හැකිවිය. මහායානය පැරදවීමත් සමග බ්‍රාහ්මණ ආගම්වලට තැනක් නොතිබීම හේතුවෙන් සිංහල බුද්ධාගම දළ වශයෙන් ගතහොත් පස්වැනි සියවසේ තිබූ ආකාරයෙන් බොහෝ දුරට ආරක්ෂා විණි.

පස්වැනි සියවසෙහි දී පමණ සිදු වූ වෙනස දීපවංසය හා මහාවංසය යන කෘති දෙකෙන් හෙළිවෙයි. දීපවංසය හතරවැනි සියවසේ ලියැවිණි යැයි සැලකෙයි. පස්වැනි සියවසේ ලියැවිණි යැයි කියැවෙන මහාවංසය බුදු සමයේ ආරක්ෂාව යන සංකල්පය දරමින් ලියැවී ඇත. මෙහි බුදුසසුන යනුවෙන් අදහස්කරන්නේ ථෙරවාදය බව පැහැදිලි ය. ථෙරවාදය  භාරතයෙන් නැති වී යෑමේ තර්ජනයට මුහුණ පෑමෙන් පසුව ඒ ප්‍රධාන වශයෙන් ගත්කල රැඳී තිබුණේ මේ දිවයිනෙහි ය. එබැවින් ථෙරවාදය රැකගැනීම සිංහල බෞද්ධයන්ගේ කාර්යයක් ලෙස සැලකීම පුදුමයක් නො වෙයි.

ගැමුණු රජ දවස සිංහල බෞද්ධ එක්සේසත් රාජ්‍ය නිල වශයෙන් ම පිහිටුවනු ලැබ තිබීම ථෙරවාදයට ආරක්ෂාව සැලසීමට රුකුලක් වූවා නිසැක ය. සිංහල ථෙරවාද බුදු සසුන ආරක්ෂාකිරීම සඳහා අවශ්‍ය මතවාද ද පස්වන සියවස වන විට සකස්කර තිබූ බව පැහැදිලි ය. බුදුන් වහන්සේ පිරිනිවන් පෑමේ දී ලංකාව දෙස බැලීම, සක් දෙවිඳුනට විජය රජු ඇතුළු පිරිස රැකබලාගැනීමට පැවසීම, විෂ්ණු දෙවියන් ඒ පිරිස ආරක්ෂාකිරීම ආදී වශයෙන් ප්‍රවාද ඒ වන විට එකතු වී තිබුණි. අවුරුදු පන්දහසක් කල් මෙරට බුදු සසුන පවතින්නේ ය යන්න කවදා එකතුවිණි දැයි කිව නොහැකි නමුත් එවැනි දෑ සිංහලයන් බුදු සසුන ආරක්ෂාකිරීම සමග බැඳී ඇත.

පස්වැනි සියවසෙහි හා ඒ ආසන්න කාලයෙහි දී ථෙරවාදයට තර්ජන නොතිබුණා නො වෙයි. දඹදිව සිට පැමිණි සංඝමිත්‍ර භික්ෂුවගේ හා මහසෙන් රජුගේ කතා පුවතින් පැහැදිලි වන්නේ ථෙරවාදයට තිබූ තර්ජනයක් (ජාත්‍යන්තර කුමන්ත්‍රණයක්) අවසානයේ දී  මැඩපවත්වා ඇති ආකාරය ය. සංඝමිත්‍ර භික්ෂුව ගෝඨාභය රජු දවස ලංකාවට පැමිණ රජුගේ දරුවන්ට ඉගැන්වීමට මඟ පාදා ගත්තේ ය. ඒ භික්ෂුව රජුගේ පුතුන් දෙදෙනාගෙන් මහසෙන් කුමරු තම වසඟයට ගැනීමට සමත් විය. මහසෙන් කුමරු රජවීමෙන් පසුව මහා විහාරයට විරුද්ධ වී පහරදුන්නේ ය. මහාවිහාර භූමිය සමතලාකර උඳු වැපිරවී ය. එහෙත් අවසානයේ දී ථෙරවාදයට රජතුමා පැරදවිය හැකි විය. රජතුමා මහාවිහාරයෙන් සමාව ගත්තේ ය. මහාවිහාරය ද එතුමාට සමාව දුන්නේ ය. මහාවංසයේ එතුමා ගැන අවසාන වශයෙන් සඳහන්වන්නේ මහසෙන් රජු බොහෝ පින් ද පව් ද  කර පරලොව ගියේ ය යනුවෙනි.

අද ඇතැමුන් මහාවිහාරය ඉන්දියාවට (භාරතයට) පක්ෂපාතී වී යැයි මතයක් ගොඩනැගීමට කටයුතුකරන්නේ මහාවිහාරය විසින් සිදුකරන ලද කාර්යය හරිහැටි තේරුම් නො ගෙන ය. මහාවිහාරය පක්ෂපාතී වූයේ ලංකාවට හා සිංහල බුද්ධාගමට ය. ඒ නිසා ම භාරතයෙන් පසුව පැමිණි නොයෙකුත් දෘෂ්ටිවාදවලින් සිංහල බුද්ධාගම ආරක්ෂාකිරීමට ඉතා ප්‍රශංසනීය උත්සාහයක් ගත්තේ ය. මහාවංසය නමින් කෘතියක් ලිවීම ද ඒ උත්සාහයේ එක් පියවරක් පමණක් විය. අප අද ද රැකෙන්නේ මහාවිහාරය විසින් කරන ලද කාර්යයන් හේතුකොටගෙන ය.

© Prof. Nalin De Silva

බුදු දහම පාලියෙන් තිබීම හේතුවෙන් ඒ වෙනස්කිරීම උගහට විය. යම් අයුරකින් බුදු දහම සිංහලෙන් පමණක් තිබුණි නම් සිංහලයන් විසින් විවිධ අර්ථකථන (අටුවා, ටීකා, ටිප්පණි) බුදු සමයට එක්කරනු ලැබීමට ඉඩ තිබුණි. එහි ප්‍රතිඵලය ලෙස සිංහල බුදු දහමෙහි හරය තව තවත් වෙනස්වීමට ඉඩ තිබුණි. එහෙත් එය වැළකී ගියේ ය. අද ද තුන්වැනි සංගායනාවේ බුදු දහම රැකී ඇත්තේ මේ කුඩා දිවයිනෙහි ය.

මහාවිහාරයට පසුකලෙක පහර එල්ල වී ඇත්තේ භාරතයෙන් බව පෙනී යයි. පස්වැනි සියවසේ දී බුද්ධඝෝෂ හිමියන්ගෙන් පසුව සිංහල පොතපත පාලියට පරිවර්තනය කිරීම දැනුම නිර්මානය සම්බන්ධයෙන් අනිසි ප්‍රතිඵල අත්කර දී ඇති නමුත්, මහාවිහාරය එසේ නොකරන්නට සිංහල බුද්ධාගම වෙනස් වී මුල දී මහායානය ද පසුව හින්දු ආගම ද විසින් සිංහල බෞද්ධ සංස්කෘතිය නැතිකරනු ලැබීමට ඉඩ තිබුණි. මහායාන හා වෙනත් මතිමතාන්තරවලට යට නො වී, එමෙන් ම ඒ මුළුමනින් ම ප්‍රතික්ෂෙප නොකර සිංහල බුද්ධාගමට අවශෝෂණය කරගැනීමට අපට පසුව හැකි වූයේ මහාවිහාරයෙහි දූරදර්ශී ක්‍රියාකලාපය හේතුකොටගෙන ය.

ඒ කෙසේ වෙතත් සිංහල ථෙරවාදී බුදු සසුන ආරක්ෂාකිරීම සඳහා පොතපත පාලියට පරිවර්තනයකිරීම හේතුවෙන් මෙරට දැනුම් නිර්මානය නම් යම්  පසුබැසීමකට ලක් වී ඇති බව පෙනෙයි. සිංහලයන්ගේ නිර්මානශීලීත්වය ඒ සමග හීනවන්නට විය. මහාවිහාරය බුදු දහම, එනම් තුන්වැනි සංගායනාවේ බුදු දහම, ආරක්ෂාකිරීමට එරෙහිව මෙරට යම් පිරිසක් මුල දී කරුණු දක්වන්නට ඇත. අනුරාධපුර මැද භාගයෙන් පමණ පසු මෙරට එතරම් දැනුමක් නිර්මානය නොවීම පාලියෙන් ග්‍රන්ථාරූඪකිරීමේ ප්‍රතිඵලයක් වීමට ඇති ඉඩකඩ ඉතා අධික ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva